පටුන

මාතෘකාව	පිටු අංකය
1. නිවාඩු	- 4
1.1 හැඳින්වීම	- 4
1.2 නිවාඩු වර්ගීකරණය	- 4
1.2.1 නිවාඩු ගත කරන ස්ථානය අනුව වර්ගීකරණය	- 4
1.2.2 ලබාදෙන නිවාඩු ප්‍රමාණය අනුව වර්ගීකරණය	- 4
1.3 නිවාඩු සටහන් කිරීම	- 4
1.4 නිවාඩු ගණන් කිරීම	- 5
2. අනියම් නිවාඩු සහ විවේක නිවාඩු	- 5
2.1 අනියම් නිවාඩු	- 5
2.2 විවේක නිවාඩු	- 5
2.2.1 විවේක නිවාඩු ලබා දීමේ දී සේවය කර තිබිය යුතු අනිවාර්ය සේවා කාලය	- 5
2.2.2 විවේක නිවාඩු මෙරටින් බැහැර ගත කිරීම	- 6
2.3 පළමු පත්වීමක දී අනියම් නිවාඩු හා විවේක නිවාඩු ගණනය කිරීම	- 6
2.4 අනියම් නිවාඩු හා විවේක නිවාඩු සංසන්දනය	- 6
3. විවේක නිවාඩු මත ගොඩනැගෙන නිවාඩු	- 7
3.1 ඉකුත් නිවාඩු	- 7
3.1.1 වෛද්‍ය හේතූන් මත ලබා දිය හැකි ඉකුත් නිවාඩු	- 7
3.1.2 වෛද්‍ය හේතූන් නොවන හේතූන් මත ලබා දිය හැකි ඉකුත් නිවාඩු	- 8
3.2 ඉපැයූ නිවාඩු	- 8
3.2.1 යටත් නිලධරයෙකුට ඉපැයූ නිවාඩු	- 8
3.2.2 මාණ්ඩලික නිලධරයෙකුට ඉපැයූ නිවාඩ	- 8
3.3 විශ්‍රාම පූර්ව නිවාඩු	- 8
4. අනෙකුත් නිවාඩු වර්ග	- 9
4.1 ප්‍රසූති නිවාඩු	- 9
4.1.1 සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූති නිවාඩ	- 9
4.1.2 අඩ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු	- 9
4.1.3 වැටුප් රහිත ප්‍රසූති නිවාඩු	- 9
4.1.4 ප්‍රසූති නිවාඩුවට අදාළ අනෙකුත් විශේෂිත කරුණු	- 9
4.1.5 පිතෘත්ව නිවාඩු	- 10
4.1.6 දරුවෙකු කුල වද්දා ගැනීම සඳහා නිවාඩු	- 10
4.2 හදිසි අනතුරු හා විශේෂ අනතුරු නිවාඩු	- 11
4.2.1 හදිසි අනතුරු නිවාඩු	- 11
4.2.2 විශේෂ අසනීප නිවාඩු	- 11
4.2.3 අනපේක්ෂිත ව්‍යසනයන් සඳහා ලබාදෙන නිවාඩු	- 12

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022
අලවතුගොඩ - මහනුවර
ලි.ප.අ: 6727

CamScanner

4.3 විශේෂිත රෝග සඳහා විශේෂ නිවාඩු - 12

4.4 හිලව් නිවාඩු - 12

4.5 විශේෂ නිවාඩු - 12

4.6 රජයේ විභාගවලට පෙනී සිටීමට නිවාඩු - 13

4.7 අනිවාර්ය නිවාඩු - 13

4.8 අඩ වැටුප් නිවාඩු - 13

4.9 වැටුප් රහිත නිවාඩු - 14

5. අධ්‍යයන සහ/හෝ රැකියා සඳහා නිවාඩු - 14

5.1 සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු - 14

5.1.1 මෙරටින් බැහැර සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක දී අනිවාර්ය සේවා කාලය - 15

5.1.2 මෙරට සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක දී අනිවාර්ය සේවා කාලය - 15

5.2 වැටුප් රහිත මෙරට අධ්‍යයන නිවාඩු - 15

5.3 විදේශ අධ්‍යයන සහ/හෝ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු - 16

5.3.1 විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු - 16

5.3.2 විදේශ අධ්‍යයන සඳහා වැටුප් රහිත නිවාඩු - 16

5.3.3 විදේශ රැකියා සහ අධ්‍යයන නිවාඩු - 17

5.3.4 විදේශ අධ්‍යයනයේ නියුත් කලත්‍රයා සමඟ විදේශගත වීම සඳහා නිවාඩු - 17

6. විශේෂිත නිලධර ගණ සඳහා නිවාඩු - 18

6.1 ගුරුවරුන් සඳහා නිවාඩු - 18

6.2 කණිෂ්ඨ නිලධරයන් සඳහා නිවාඩු - 18

6.3 දෛනික වැටුප් ලබන නිලධරයෙකුගේ නිවාඩු - 19

6.4 පොලිස් සැරයන්වරු සහ කොස්තාපල්වරුන්ගේ නිවාඩු - 19

6.5 ආධුනිකයෙකු සහ අභ්‍යාසලාභියෙකු සඳහා නිවාඩු - 19

6.6 අනියම් නිලධරයන් සඳහා නිවාඩු - 19

6.7 රාජ්‍ය සංස්ථාවක සේවය සඳහා මුදාහළ නිලධරයෙකුගේ නිවාඩු - 19

6.8 විශ්‍රාම ගැනීමෙන් අනතුරුව සේවයේ යොදවන නිලධරයෙකුගේ නිවාඩු - 20

7. දිවයිනෙන් බැහැර නිවාඩු - 20

7.1 මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයන් සඳහා දිවයිනෙන් බැහැර නිවාඩු - 20

7.2 යටත් නිලධරයන්ට දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා නිවාඩු - 21

7.3 කණිෂ්ඨ නිලධරයෙකුට දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා නිවාඩු - 21

7.4 විදේශ නිවාඩු අනුමතියක දී පවතින සීමා - 21

7.5 දිවයිනෙන් බැහැර නිවාඩු අනුමතිය ලබා ගන්නා නිලධරයෙකුගේ වගකීම - 21

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022
අලවතුගොඩ - මහනුවර
ලි.ප.අ: 6727

1. නිවාඩු හැඳින්වීම හා මූලික වර්ගීකරණය

1.1 හැඳින්වීම

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදය හෙවත් නිවාඩු පරිච්ඡේදය රාජ්‍ය නිලධරයන් අතර වඩාත් කතා බහට ලක්වන ප්‍රචලිත මෙන්ම විධිවිධාන සම්බන්ධයෙන් ඉතා විශාල ගැටලු ප්‍රමාණයක් මතුවන පරිච්ඡේදයක් ලෙස මූලිකව හඳුනාගත හැකි ය. සියලුම රජයේ නිලධරයන් තරයේ සිහියට නඟාගත යුතු කරුණක් වනුයේ **නිවාඩු යනු වරප්‍රසාදයක් මිස අයිතිවාසිකමක් නොවන බවයි.** නිවාඩු ලබා දීම සේවයේ අවශ්‍යතාවන්ට යටත් වන අතර අනුමත කර ඇති නිවාඩු කාල සීමාවක් වුව ද අඩු කිරීමට හෝ අවලංගු කිරීමට නිවාඩු අනුමත කරන බලධරයාට අභිමතය පවතී.

1.2 නිවාඩු වර්ගීකරණය

රාජ්‍ය නිලධරයන්ගේ නිවාඩු වර්ගීකරණ කිහිපයක් යටතේ සලකා බැලිය හැකි අතර මෙහි දී සරල මූලික වර්ගීකරණ දෙකකට අවධානය යොමු කරමු.

1.2.1 නිවාඩුව ගත කරන ස්ථානය අනුව වර්ගීකරණය

සියලු නිවාඩු, නිවාඩු ගත කරන ස්ථානය අනුව,

- මෙරට ගත කරන නිවාඩු
- මෙරටින් බැහැර ගත කරන නිවාඩු

ලෙස වර්ගීකරණය කළ හැක. මෙරට ගත කරන නිවාඩු සඳහා ඉල්ලුම් කිරීමේ දී පොදු 125 'අ' ආකෘතිපත්‍රය භාවිත කළ යුතු අතර මෙරටින් බැහැර නිවාඩු ඉල්ලුම් කිරීමේ දී පොදු 126 ආකෘතිපත්‍රය භාවිත කළ යුතු ය.

1.2.2 ලබා දෙන නිවාඩු ප්‍රමාණය අනුව වර්ගීකරණය

මෙහි දී වර්ෂයක් තුළ ලබා දෙන නිවාඩු ප්‍රමාණයක් උපරිම සීමාව අනුව,

- අනියම් නිවාඩු
- විවේක නිවාඩු

ලෙස වර්ගීකරණය කළ හැකි අතර මෙම නිවාඩු සම්බන්ධයෙන් පුළුල් ලෙස ඉදිරි පරිච්ඡේදවල දී සාකච්ඡා කෙරේ.

1.3 නිවාඩු සටහන් කිරීම

සියලු රාජ්‍ය ආයතන එක් එක් නිලධරයාට අනුමත කරන නිවාඩු ප්‍රමාණය පිළිබඳ වාර්තා පොදු 190 ආකෘති පත්‍රය ප්‍රකාරව පවත්වාගෙන යාම අනිවාර්ය වේ. රාජ්‍ය නිලධරයෙකු එක් සේවා ස්ථානයකින් තවත් සේවා ස්ථානයකට ස්ථාන මාරු වී යන අවස්ථාවක එම නිලධරයා පළමු පත්වීමේ සිට එක් එක් වර්ෂය තුළ ලබා ගෙන ඇති විවේක/ අසනීප නිවාඩු ප්‍රමාණය, අඩ වැටුප් සහිත නිවාඩු ප්‍රමාණය, වැටුප් රහිත නිවාඩු ප්‍රමාණය සහ ස්ථාන මාරුව ලබා යන වර්ෂය තුළ ලබා ගෙන ඇති අනියම් නිවාඩු ප්‍රමාණය පිළිබඳ තොරතුරු නව සේවා ස්ථානය වෙත වාර්තා කළ යුතු ය.

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022
අලවතුගොඩ - මහනුවර
ලි.ය.අ: 6727

1.4 නිවාඩු ගණන් බැලීම

අනියම් නිවාඩු, සෙනසුරාදා, ඉරිදා හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින අතහැර ගණන් බැලිය යුතු ය. විවේක නිවාඩු ගණන් බැලීමේ දී එකී විවේක නිවාඩුව ගත කරන්නේ මෙරට දී නම් ඉහත අනියම් නිවාඩුවල දී ගණනය කළ ආකාරයට සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින අතහැරිය යුතු අතර විවේක නිවාඩුව මෙරටින් බැහැර ගත කරන අවස්ථාවක දී එකී නිවාඩු තුළට වැටෙන සෙනසුරාදා, ඉරිදා හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින නිවාඩුවට ඇතුළත් කර ගණන් බැලිය යුතු ය.

අඩ වැටුප් සහිත හෝ වැටුප් රහිත නිවාඩු කාලයක් තුළට ගැනෙන සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින ද නිවාඩුවට ඇතුළත් කර ගණන් බැලිය යුතු ය.

2. අනියම් නිවාඩු සහ විවේක නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ විධිවිධාන අනුව රාජ්‍ය නිලධරයන්ට ලබා දිය හැකි නිවාඩු ප්‍රමාණය ප්‍රධාන නිවාඩු වර්ග 02ක් යටතේ වර්ග කර ඇත. එනම්,

- අනියම් නිවාඩු
- විවේක නිවාඩු.

2.1 අනියම් නිවාඩු

XII වැනි පරිච්ඡේදයේ 5 වගන්තියෙහි දක්වා ඇති මෙම අනියම් නිවාඩු වරකට දින 06ක උපරිමයකට යටත්ව වර්ෂයක් තුළ දින 21ක් දක්වා ලබා දිය හැකි ය. නිවාඩු ලබා දිය හැක්කේ මෙරට ගත කිරීම සඳහා පමණි. ලිත් වර්ෂ පදනමින් ගණනය කරන මෙම නිවාඩු ලබා දීම සඳහා රාජ්‍ය නිලධරයෙකු වර්ෂය තුළ අවම සේවා කාලයක් සේවය කිරීම හෝ පළමු පත්වීමක දී අවම සේවා කාලයක් සේවය කිරීම හෝ අනිවාර්ය නැත. කිසිදු අවස්ථාවක අනියම් නිවාඩු අනුපාතික පදනමින් ලබා දීමේ විධිවිධාන නොමැත.

2.2 විවේක නිවාඩු

XII වැනි පරිච්ඡේදයේ 8 වගන්තියෙහි සඳහන් විවේක නිවාඩු සතියේ දින 07ම රාජකාරි කරන නිලධරයෙකුට වර්ෂයකට දින 28ක ද, අනෙක් නිලධරයන්ට වර්ෂයකට දින 24ක ද උපරිමයකට යටත්ව ලබා දිය හැක. එක් වර්ෂයක් තුළ දී එම වර්ෂයේ හා ඊට කලින් වර්ෂයේ ඉතිරි කරගත් විවේක නිවාඩු සමුච්චිත විවේක නිවාඩු ලෙස වර්ෂයක දී දින 48ක උපරිමයකට යටත්ව භාවිත කිරීමට නිලධරයෙකුට විශේෂ බාධාවකින් තොරව අවසර දිය හැක. එක් එක් වර්ෂය තුළ ඉතිරි කරගන්නා විවේක නිවාඩු තම සේවා කාලය සමඟ ඉදිරියට රැගෙන යා හැක.

2.2.1 විවේක නිවාඩු ලබා දීමේ දී සේවය කර තිබිය යුතු අනිවාර්ය සේවා කාලය

විවේක නිවාඩු ලබා දීම සඳහා රාජ්‍ය නිලධරයෙකු අදාළ වර්ෂය තුළ අනිවාර්ය සේවා කාලයක් සේවය කර තිබිය යුතු ය. රාජ්‍ය සේවයට පළමු පත්වීම ලබන රාජ්‍ය නිලධරයෙකු වර්ෂයක් තුළ ලබා ගත හැකි උපරිම විවේක නිවාඩු ප්‍රමාණය ලබා ගැනීමට නම් මාස 09ක අවම අනිවාර්ය සේවා කාලයක් සේවයේ යෙදිය යුතු ය. වෛද්‍ය සහතික මඟින් ආවරණය වන අවස්ථාවල දී හෝ වෙනත් බරපතල හදිසි අවස්ථාවල දී මෙම නියමයෙන් පරිබාහිරව සේවයේ යෙදී සිටින පළමු වසරේ සේවය කර ඇති එක් එක් මාසය වෙනුවෙන් වාර්ෂික විවේක නිවාඩුවෙන් 1/9 කොටස බැගින් ලබා දිය හැක.

අධ්‍යාපන අනධ්‍යයන
සේවක සංගමය
2022
අලවතුගොඩ - මහනුවර
ලි.ප.අ: 6727

අනෙකුත් රාජ්‍ය නිලධරයන් උපරිම වාර්ෂික විවේක නිවාඩුවට හිමිකම් ලැබීමට නම් වර්ෂය තුළ මාස 03ක් සේවය කළ යුතු අතර එහෙත් ඊට පෙර නිවාඩු ලබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවල දී සේවය කළ එක් එක් මාසය වෙනුවෙන් 1/3ක කොටස බැගින් නිවාඩු ලබා දිය හැකි ය.

2.2.2 විවේක නිවාඩු මෙරටින් බැහැර ගත කිරීම

විවේක නිවාඩු මෙරටින් බැහැර ගත කිරීමේ දී එම නිවාඩු කාල පරිච්ඡේදය තුළට වැටෙන සෙනසුරාදා, ඉරිදා හා රජයේ ප්‍රසිද්ධ නිවාඩු ද නිවාඩු දින ලෙස ගණනය කෙරේ. දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා සමුච්චිත නිවාඩු සාමාන්‍යයෙන් වර්ෂයක දී දින 48ක උපරිමයකට යටත්ව ලබා දිය හැකි අතර මාණ්ඩලික නිලධරයෙකුට පමණක් විශේෂ වරප්‍රසාදයක් ලෙස නිවාඩුව ලබා ගන්නා අවුරුද්දේත් ඊට කලින් වර්ෂ දෙකෙහිත් ඉතිරි විවේක නිවාඩු උපරිමව දින 72ක් දක්වා ලබා දිය හැකි ය.

මෙරටින් බැහැර ගත කළ නිවාඩුවකින් අනතුරුව රාජකාරියට වාර්තා කළ නිලධරයෙකුට මාස 09ක් සේවය කිරීමට පෙර නැවත දිවයිනෙන් බැහැර නිවාඩුවක් අනුමත කිරීමට නම් එසේ අනුමත කළ හැක්කේ එම වර්ෂය තුළ නිලධරයා කිසිදු නිවාඩුවක් භාවිත කර නොමැති නම් නිවාඩු සිට පැමිණි වර්ෂයේ ඉතිරි විවේක නිවාඩුවලින් 1/9ක ප්‍රමාණයක් හා ඊළඟ වර්ෂයේ සේවය කර ඇති සම්පූර්ණ මාසයක් සඳහා වාර්ෂික විවේක නිවාඩුවෙන් 1/3ක කොටසක් පමණි.

2.3 පළමු පත්වීමක දී අනියම් නිවාඩු හා විවේක නිවාඩු ගණනය කිරීම

රාජ්‍ය සේවයට පළමු පත්වීම ලබන නිලධරයෙකුට අනියම් නිවාඩු ගණනය කිරීමේ දී ලිත් වර්ෂ පදනමින් ගණනය කළ යුතු වේ. එනම් පත්වීම් දිනය කුමක් වුව ද අදාළ ලිත් වර්ෂය තුළ ලබා දිය හැකි උපරිම අනියම් නිවාඩු ප්‍රමාණය වන දින 21ක ප්‍රමාණය අවශ්‍ය වන්නේ නම් නිවාඩු අනුමත කරන බලධරයාට එම වර්ෂය ඇතුළත ලබා දීමට අනුමත කළ හැක.

එසේ වුවද විවේක නිවාඩු ගණනය කිරීමේ දී පළමු වසර දෙක සඳහා පත්වීම් දිනය පදනම් කර ගනිමින් වාර්ෂික විවේක නිවාඩු ගණනය සිදු කළ යුතු අතර වසර දෙක අවසාන වන ලිත් වර්ෂයේ ඉතිරි කාලයේ ඉතිරිව ඇති එක් එක් මාසය සඳහා වාර්ෂික විවේක නිවාඩුවෙන් 1/12 කොටස බැගින් අනුපාතිකව විවේක නිවාඩු ගණනය කළ යුතු ය.

නිදර්ශනය

අනියම් නිවාඩු	විවේක නිවාඩු
2013.10.01 සිට 2013.12.31 දක්වා - දින 21	2013.10.01 සිට 2014.09.30 දක්වා - දින 24
2014.01.01 සිට 2014.12.31 දක්වා -දින 21	2014.10.01 සිට 2015.09.30 දක්වා -දින 24
2015.01.01 සිට 2015.12.31 දක්වා - දින 21	2015.10.01 සිට 2015.12.31 දක්වා - 24×3/12 = දින 06
2016.01.01 සිට 2016.12.31 දක්වා - දින 21	2016.01.01 සිට 2016.12.31 දක්වා - දින 24

2.4 අනියම් නිවාඩු හා විවේක නිවාඩු සංසන්දනය

අනියම් හා විවේක නිවාඩුවල විධිවිධාන පහත පරිදි සාරාංශ සංසන්දනාත්මක වගුගත කිරීමකින් ඉදිරිපත් කළ හැකි ය.

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022
අලවතුගොඩ - මහනුවර
ලි.ප.අ: 6727

නිවාඩු වර්ගය	වර්ෂයකට හිමි ප්‍රමාණය	ලබා ගත හැකි ආකාරය (සීමාව)	ගත කළ හැකි ආකාරය	ඉතුරු තිබේ නම් ඉදිරි වර්ෂ සඳහා ගෙන යාමේ හැකියාව	පළමු පත්වීමේදී ගණනය කරන ආකාරය
අනියම්	21	වරකට උපරිම දින 06	මෙරට දී පමණි	හැකියාවක් නැත.	ලිත් වර්ෂය පදනම් කර ගනී
විවේක	24 හා 28	එක් වරකට උපරිම සීමා කිරීමක් නැත.	මෙරට දී හෝ මෙරටින් බැහැර	හැකියාවක් ඇත.	පළමු පත්වීමේ සිට වසර 02ක් සඳහා පත්වීම් දිනය පදනම් කර ගෙන හා ඊළඟ ලිත් වර්ෂයේ ආරම්භයේ සිට ලිත් වර්ෂ පදනමින්

3. විවේක නිවාඩු මත ගොඩනැගෙන නිවාඩු

රාජ්‍ය නිලධරයන්ට එක් වසරක් තුළ උපරිම වශයෙන් දින 24කට යටත්ව විවේක නිවාඩු ලබා දීමේ හැකියාව සම්බන්ධයෙන් විවේක නිවාඩුවල දී තුළ සාකච්ඡා කරන ලදී. එමෙන්ම එක් එක් වර්ෂය තුළ ඉතිරි කරගන්නා විවේක නිවාඩු සිය සේවා කාලය සමග ඉදිරියට රැගෙන යාමේ හැකියාව පිළිබඳව ද අප එහි දී අවධානය යොමු කරන ලදී. එසේ තම සේවා කාලය සමග ඉදිරියට රැගෙන යා හැකි විවේක නිවාඩුවල භාවිතය මෙම පරිච්ඡේදය තුළ දී අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ. මෙම ඉතිරි කරගන්නා විවේක නිවාඩු මත ගොඩ නැගී ඇති ප්‍රධාන නිවාඩු වර්ග 03ක් පිළිබඳ අප මෙහි දී අවධානය යොමු කරනු ලැබේ.

i. ඉකුත් නිවාඩු
ii. ඉපයූ නිවාඩු
iii. විශ්‍රාම පූර්ව නිවාඩු

3.1 ඉකුත් නිවාඩු

රාජ්‍ය නිලධරයෙකුට එක් වර්ෂයක් තුළ හාමිකයට ගත හැකි සමුච්චිත විවේක නිවාඩු සියල්ල අවසන් වූ පසු තම සේවා කාලය තුළ ඉතිරි කර ගත් විවේක නිවාඩු භාවිත කිරීමේ අවස්ථාව මෙම ඉකුත් නිවාඩු හරහා ලබා දී ඇත . ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය යටතේ සඳහන් වන මෙම ඉකුත් නිවාඩු භාවිත කළ හැකි අවස්ථා කිහිපයකි.

i. පවුලේ අයෙකු අසනීප වීම
ii. පවුලේ අයෙකුගේ මරණය
iii. ඉහත සඳහන් කුමක් හෝ සම්බන්ධයෙන් පැවැත්වෙන ආගමික උත්සවයක්
iv. නිලධරයාගේ විවාහය
v. නිලධරයාගේ ගෙදර අයෙකුට බෝවන රෝගයක් වැළඳීම
vi. නියම වශයෙන්ම රාජකාරි ඉටුකිරීම හා සම්බන්ධ නොවූ නඩුවක දී සිතාසි පිට උසාවියේ පෙනී සිටීම
vii. නිලධරයා අසනීප වීම

ඉහත අවස්ථා යටතේ ලබා දිය හැකි විවේක නිවාඩු ලබා දෙන ආකාරය හා ප්‍රමාණය මත කොටස් 02කට වර්ග කර දැක්විය හැක.

3.1.1 වෛද්‍ය හේතු මත ලබා දිය හැකි ඉකුත් නිවාඩු

එනම් නිලධරයාගේ අසනීප තත්ත්වය මත ලබා දිය හැකි ඉකුත් නිවාඩු ප්‍රමාණය මේ යටතට ගැනේ. මෙහි දී වර්ෂය තුළ ලබා දිය හැකි සියලුම සමුච්චිත විවේක නිවාඩු අවසන් වූ පසු තම සේවා කාලය තුළ ඕනෑම වර්ෂ 02ක ඉතිරි කර ගත් විවේක නිවාඩු භාවිත කිරීමට නිලධරයෙකුට අවසර දිය හැක. එකී වෛද්‍ය හේතූන් මත එම වර්ෂ

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022

02ක ඉකුත් නිවාඩු ද ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ අවසරය මත තවත් ඕනෑම වසර 02ක ඉතිරි කරගත් විවේක නිවාඩු ඉකුත් නිවාඩු ලෙස භාවිත කිරීමට එක් වර්ෂයක් තුළ දෙවන වතාවටත් රාජ්‍ය නිලධරයෙකුට අවස්ථාව ලබා දිය හැක. ඒ අනුව එක් වර්ෂයක් තුළ උපරිම දින 96ක් දක්වා ඉකුත් නිවාඩු භාවිත කිරීමේ අවස්ථාව රාජ්‍ය නිලධරයෙකුට ලබාදීමේ හැකියාව පවතී.

3.1.2 වෛද්‍ය හේතූන් නොවන හේතූන් මත ලබා දිය හැකි ඉකුත් නිවාඩු

ඉකුත් නිවාඩු ලබා දිය හැකි අවස්ථා ලෙස ඉහත සාකච්ඡා කළ කරුණු අතුරින් නිලධරයන්ට අසනීපයක දී හැර අනෙකුත් අවස්ථා මෙමගින් ආවරණය වේ. මෙහි දී නිලධරයෙකුට එක් වසරක් තුළ ලබා දිය හැක්කේ තම සේවා කාලය තුළ ඕනෑම අනුගාමී වර්ෂ 02ක ඉතිරි කරගත් විවේක නිවාඩු ප්‍රමාණය පමණි. වෛද්‍ය හේතූන් මත ලබා දිය හැකි ඉකුත් නිවාඩු පිළිබඳ සාකච්ඡා කළ පරිදි එක් වර්ෂයක් තුළ දෙවන අවස්ථාව සඳහා ඉකුත් නිවාඩු ලබා දීමට මෙහි දී හැකියාවක් නැත. ඒ අනුව උපරිමව වර්ෂයක් තුළ ලබා දිය හැකි ඉකුත් නිවාඩු ප්‍රමාණය දින 48කට සීමා වේ.

3.2 ඉපයූ නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 17 වගන්තිය යටතේ සාකච්ඡා කෙරෙන මෙම ඉපයූ නිවාඩු අදාළ වනුයේ රාජ්‍ය නිලධරයන්ගේ වැටුප් රහිත මෙරට හෝ මෙරටින් බැහැරගත කරන නිවාඩුවක දී ඒ වෙනුවට හෝ ඉන් කොටසක් වෙනුවට මෙම නිවාඩු භාවිත කිරීම පිළිබඳව ය. ඒ අනුව ඉපයූ නිවාඩු අදාළ වනුයේ වැටුප් රහිත අධ්‍යයන කටයුතු සඳහා පමණක් වන අතර වැටුප් රහිත විදේශ රැකියා අවස්ථාවන් සඳහා මෙම නිවාඩු භාවිත කිරීමේ හැකියාව නොපවතී. මෙම නිවාඩු ලබා දෙන ආකාරය යටත් නිලධරයෙකු හා මාණ්ඩලික නිලධරයෙකු සම්බන්ධයෙන් දෙයාකාරයකි.

3.2.1 යටත් නිලධරයෙකුට ඉපයූ නිවාඩු

යටත් නිලධරයෙකුට මෙරට ගත කළ ද, මෙරටින් බැහැරව ගත කළ ද ඉපයූ නිවාඩු ලෙස ලබා ගත හැකි වනුයේ පවත්නා වර්ෂය හා ඊට කලින් වර්ෂයේ ඉතිරිව තිබෙන විවේක නිවාඩු සහ සිය සේවා කාලය තුළ ඕනෑම අනුගාමී වර්ෂ 02ක ඉතිරි කර ගත් විවේක නිවාඩු ය.

3.2.2 මාණ්ඩලික නිලධරයෙකුට ඉපයූ නිවාඩු

මාණ්ඩලික නිලධරයෙකුට ලබා දිය හැකි ඉපයූ නිවාඩු මෙරට හා මෙරටින් බැහැර ගත කිරීම අනුව එකිනෙකට වෙනස් වේ. මෙරටින් බැහැර ගත කිරීමේ දී ඉපයූ නිවාඩු ලෙස අදහස් කරනුයේ උපරිම කාලසීමාව මාස 06කට යටත්ව පවත්නා වර්ෂය හා ඊට කලින් දෙවර්ෂයේ ඉතිරි විවේක නිවාඩු සහ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 21 වගන්තිය අනුව අඩ වැටුප් නිවාඩු යටතේ ලබා ගත හැකි පරිවර්තිත අඩ වැටුප් නිවාඩු වේ. මෙරට ගත කිරීමේ දී මාණ්ඩලික නිලධරයෙකුට සිය අභිමතය පරිදි යටත් නිලධරයෙකු සම්බන්ධ අදාළ වන විධිවිධානය හෝ උපරිමය මාස 03කට යටත්ව පරිවර්තිත අඩ වැටුප් නිවාඩු ඉපයූ නිවාඩු ලෙස භාවිත කිරීමේ අවස්ථාව පවතී.

3.3. විශ්‍රාම පූර්ව නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 8 වගන්තිය යටතේ විවේක නිවාඩු සඳහා හිමිකම් ලබන රාජ්‍ය නිලධරයෙකු සහ 26 වගන්තිය යටතේ නිවාඩු ලබා දෙන කනිෂ්ඨ නිලධරයෙකුට තමා විශ්‍රාම ගන්නා අවස්ථාවේ දි සිය සේවා කාලය තුළ ඕනෑම පෙර වර්ෂ 02ක ඉතිරි කරගෙන තිබෙන විවේක/අසනීප නිවාඩු සහ පවත්නා වර්ෂයේ ලබා ගත හැකි විවේක/අසනීප නිවාඩු විශ්‍රාම පූර්ව නිවාඩු ලෙස ලබා දීමට ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 11 වගන්තියෙහි විධිවිධාන සැලසී ඇත .

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022
අලවතුගොඩ - මහනුවර

මෙම විධිවිධානයන්ට අමතරව 2010.09.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2010 මගින් ද විශ්‍රාම පූර්ව නිවාඩු ලබා දීමට අදාළ විධිවිධාන හඳුන්වා දී ඇති අතර නිලධරයෙකුට ඉහත අවස්ථා 02 යටතේ තමාට වඩාත් වාසිදායක ඕනෑම ආකාරයකට විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමේ අවස්ථාව සලසා දිය හැක.

4. අනෙකුත් නිවාඩු වර්ග

රාජ්‍ය නිලධරයන්ට ලබාදිය හැකි පෞද්ගලික නිවාඩු ප්‍රධාන වශයෙන් අනියම් හා විවේක යන වර්ගීකරණය යටතේ ප්‍රධාන වශයෙන් මෙතෙක් සාකච්ඡාවට ගැනුණි. ප්‍රධාන වශයෙන්ම මෙහි විශේෂ වැදගත්කමක් ගන්නා විවේක නිවාඩු හා විවේක නිවාඩු මත ගොඩනැගෙන අනෙකුත් නිවාඩු වර්ග පිළිබඳ පූර්ණ අවබෝධයක් පෙර පරිච්ඡේද හරහා අවධානය යොමු කෙරුණි. ඊට අමතර රාජ්‍ය නිලධරයෙකුට විශේෂිත වූ කාරණා උදෙසා ලබා ගත හැකි නිවාඩු වර්ග කිහිපයක් පිළිබඳව මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ. ඒවා වෙන් වෙන් වශයෙන් පහත මාතෘකා යටතේ සාකච්ඡා කළ හැක.

4.1 ප්‍රසූති නිවාඩු

ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී රාජ්‍ය නිලධාරිනියන් ප්‍රසූති නිවාඩු හිමිකම ලබති. මෙම ප්‍රසූති නිවාඩු පියවර 03ක් යටතේ රාජ්‍ය නිලධාරිනියකට ලබා ගත හැක. ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 18 වගන්තිය මීට අදාළ වේ.

4.1.1 සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු

සෑම සජීවී දරු උපතක් වෙනුවෙන්ම රජයේ වැඩකරන දින 84ක සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු හිමි වේ. රාජ්‍ය නිලධාරිනියකට දරු ප්‍රසූතිය සිදු වී සති 04ක් ගතවන තුරු රාජකාරියට වාර්තා කිරීමට කිසිසේත් ඉඩ ලබා දෙනු නොලැබේ. උපතේදීම මරණය සිදුවන දරු උපතක දී හෝ ප්‍රසූතියෙන් සති 06ක් ඉක්මයාමට පෙර දරුවා මරණයට පත්වන අවස්ථාවක දී උපත සිදු වූ දින සිට සති 06ක නිවාඩුවක් නිලධාරිනියකට ලබා දිය යුතු ය.

4.1.2 අඩ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු

සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූති නිවාඩුවලින් අනතුරුව දරුවා රැකබලා ගැනීම වෙනුවෙන් දින 84ක අඩ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු රාජ්‍ය නිලධාරිනියකට ලබා දිය හැකි ය. මෙම කාල පරිච්ඡේදයට ගැනෙන සෙනසුරාදා, ඉරිදා, රජයේ නිවාඩු දින අඩ වැටුප් සහිත දින ලෙස සැලකිය යුතු ය.

4.1.3 වැටුප් රහිත ප්‍රසූති නිවාඩු

සම්පූර්ණ වැටුප් සහිත සහ අඩු වැටුප් සහිත ප්‍රසූති නිවාඩු අවසන් වීමෙන් පසු තවදුරටත් දරුවා රැකබලා ගැනීම වෙනුවෙන් දින 84ක වැටුප් රහිත ප්‍රසූති නිවාඩු ලබාදිය හැකි අතර අඩ වැටුප් සහිත ප්‍රසූති නිවාඩුවක දී මෙන්ම මෙම කාල පරිච්ඡේදය තුළට ගැනෙන සෙනසුරාදා, ඉරිදා, රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින වැටුප් රහිත නිවාඩු ලෙස සැලකේ.

4.1.4 ප්‍රසූති නිවාඩුවට අදාළ අනෙකුත් විශේෂිත කරුණු

රාජ්‍ය නිලධාරිනියකට ගබ්සාවීමක් හේතු කොට ගෙන නිවාඩු අවශ්‍ය වූ විටක එම නිවාඩු වෛද්‍ය සහතිකයක් මත තම විවේක නිවාඩුවලින් ලබාගත යුතු ය. සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු අවසන් වූ පසු අඩ වැටුප් සහිත ප්‍රසූති නිවාඩු ලබා නොගන්නා නිලධාරිනියකට දරුවාට මාස 06ක් වනතෙක් මව්කිරි දීම සඳහා සේවා ස්ථානයෙන් පිටවන වේලාවට පැයකට කලින් සේවා ස්ථානයෙන් පිටත්ව යාමට අවසර දිය යුතු ය. එමෙන්ම නිලධාරිනිය

අධ්‍යාපන අමාත්‍යාංශ සේවක සංගමය
01 JUN 2022

ගර්භනී අවස්ථාවේ මාස 05 සම්පූර්ණ වූ විට රාජකාරි ආරම්භ වන වේලාවට පැය ½ක් ප්‍රමාද වී පැමිණීමට හා රාජකාරි අවසන්වල වේලාවට පැය ½කට කලින් පිටව යාමට හෝ උදේ හෝ සවස් වරුවෙන් සම්පූර්ණ කාලය එකට ගෙන පැයක් ලෙස ප්‍රමාද වී පැමිණීමට හෝ කලින් පිටව යාමට අවසර දීමට හැකි ය. නිලධාරිනියට අඩ වැටුප් සහිත නිවාඩු හෝ වැටුප රහිත නිවාඩු ලබා දෙන්නේ දරුවාගේ රැකවරණය හා පෝෂණය උදෙසා වන අතර එම නිවාඩු කාල පරිච්ඡේදය තුළ දී දරුවා යම් හෙයකින් මිය ගිය හොත් මිය ගිය දිනයේ සිට දින 07කට පසු එම නිවාඩු අවලංගු වේ. කෙසේ වෙතත් එකී දින 07 අවස්ථාවෝචිතව අඩ වැටුප් හෝ වැටුප් රහිත ලෙස සාමාන්‍යයෙන් සලකන අතර, නිලධාරිනියට එම වර්ෂයේ විවේක නිවාඩු ඉතිරිව පැවතිය හොත් එම නිවාඩුවලින් ඉහත කී කාල සීමාව ආවරණය කර ගැනීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමතිය මත අවසර ලබා දිය හැකි ය. නිලධාරිනියට ලබාදෙන අඩ වැටුප් සහිත හෝ වැටුප් රහිත නිවාඩු කාල සීමාව වැටුප් වර්ධක කාර්යයන් සඳහා ද විශ්‍රාම වැටුප් කාර්ය සඳහා ද බාධාවක් නොවිය යුතු අතර එකී කාල සීමාව තුළ ඇතිවන පුරප්පාඩු, උසස්වීම් සඳහා බාධාවක් ලෙස මෙම නිවාඩු නොසැලකිය යුතු ය.

4.1.5 පීතෘත්ව නිවාඩු

රජයේ ස්ථිර, තාවකාලික, අනියම් හෝ අභ්‍යාසලාභී නිලධරයෙකුගේ භාර්යාවකට දරුවෙකු ඉපදීම වෙනුවෙන් උපතේ සිට මාස 03ක් ඇතුළත කාලය තුළ දින 03ක විශේෂිත පීතෘත්ව නිවාඩුවක් ලබා ගත හැකි ය.

4.1.6 දරුවෙකු කුල වද්දා ගැනීම සඳහා නිවාඩු

දරුවෙකු කුල වද්දා ගැනීම වෙනුවෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමතිය මත මාස 03ක උපරිම කාලයක් සඳහා තමන් විසින් ඉතිරි කර ගත් සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු හෝ අඩ වැටුප් සහිත නිවාඩු හෝ වැටුප් රහිත නිවාඩු හෝ රාජ්‍ය නිලධාරිනියකට ලබා දිය හැකි ය.

එසේ ලබාදෙන නිවාඩු, ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ විධිවිධාන අනුව පහත අනුපිළිවෙළට උපරිම මාස 03ක් දක්වා ලබා දේ.

I. 5 හා 8 වගන්ති අනුව නිලධාරිනියට හිමි පවත්නා වර්ෂයේ නිවාඩු.
II. 10:1:2 හා 10:1:5 උප වගන්ති අනුව ඉකුත් නිවාඩු.
III. 21 වගන්තිය අනුව අඩ වැටුප් නිවාඩු.
IV. 22 වගන්තිය අනුව වැටුප් රහිත නිවාඩු.

මෙම නිවාඩු ලබා දීමේ දී පහත කොන්දේසි හා නියමයන් අදාළ වේ.

I. හදා වඩා ගැනීම සඳහා ලබා ගන්නා දරුවාගේ වයස දින 84කට අඩුවිය යුතු අතර, එම දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

II. දරුවා ලබා ගැනීම උසාවි නියෝගයක් මත නීත්‍යානුකූලව සිදුවිය යුතු අතර එම නියෝගයේ පිටපතක් නිවාඩු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ. නඩු තීන්දුව ලැබීමට කල් ගත වන අවස්ථාවක දී මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සපුරා ඇත්නම් පමණක් නඩු කටයුත්ත අවසන් වූ පසු එම නීත්‍යානුකූල නියෝගයේ පිටපතක් ලබා ගැනීමට යටත්ව අධිකරණය ඉදිරියේ නඩු කටයුත්තක් සිදුවන බවට සනාථ කෙරෙන ප්‍රමාණවත් තොරතුරු මත මෙම විශේෂ නිවාඩුව ලබා දිය යුතු ය.

III. අඩ වැටුප් සහිත හෝ වැටුප් රහිත නිවාඩු ලබා දීමට පෙර නිලධරයාට ලබා දී තිබූ ණය හෝ අත්තිකාරම්වල මාසික වාරික නොකඩවා අය කර ගැනීම සඳහා සතුටුදායක වැඩ පිළිවෙළක් යෙදීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු ය.

IV. ඉහත පරිදි හිමිකම් ලබන නිවාඩුව දරුවාගේ උපතේ සිට අවුරුද්දක් ඇතුළත ලබාගත යුතු ය.

අධ්‍යාපන අභ්‍යාසයන සේවක සංගමය
01 JUN 2022

4.2 හදිසි අනතුරු හා විශේෂ අනතුරු නිවාඩු

රාජ්‍ය නිලධරයෙකුට තමාට සිදුවන හදිසි අනතුරක දී හෝ රාජකාරියේ වැදගත් අනිවාර්ය අවස්ථාවක දී විශේෂ නිවාඩු ලබාගැනීමට ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 9 වගන්තියෙහි විධිවිධාන පහත සලසා ඇත.

4.2.1 හදිසි අනතුරු නිවාඩු

රජයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත හෝ රහිත තනතුරක් දරන රජයේ නිලධරයෙකු හෝ අධිකරණ නිලධරයෙකුට පහත අවස්ථාවන් සඳහා හදිසි අනතුරු නිවාඩු සඳහා හිමිකම ලැබේ.

ඔහුගේ රාජකාරි ඉටු කිරීමේ දී,

හෝ

ඔහු රාජකාරි ඉටු නොකරන අවස්ථාවක දී වුවද, ඔහුගේ සාමාන්‍ය රාජකාරි විෂය සීමාව ඇතුළත වූ යම් ක්‍රියාවක් කිරීමේ දී

හෝ

ඔහුගේ රාජකාරි කටයුතු ඉටු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්

හෝ

ඔහුගේ වාසස්ථානයේ සිට රාජකාරි සඳහා වාර්තා කිරීම පිණිස සේවා ස්ථානය දක්වා,

හෝ

රාජකාරියෙන් පසු ඔහුගේ සේවා ස්ථානයේ සිට වාසස්ථානය දක්වා හෝ යන ගමනක දී,

හෝ

සේවා ස්ථානයේ සිට රාජකාරි කටයුතුවල නිරත වීම සඳහා යන ගමනක දී සහ සේවා ස්ථානයට ආපසු එන ගමනක දී හෝ තුවාල සිදු වුවහොත්

නමුත් එම තුවාල සිදු වීම පහත අවස්ථාවන් යටතේ සිදු වී නොමැති නම් තුවාලයේ ස්වභාවය හා වෛද්‍ය මණ්ඩල නිර්දේශ මත වර්ෂයක් දක්වා වැටුප් සහිත හා අනතුරුව මාස 06ක් දක්වා අඩ වැටුප් සහිත නිවාඩු අනුමත කිරීමට අමාත්‍යාංශ ලේකම්ට හැකියාව ඇත. මිට අමතරව තමාට හිමි ඉකුත් නිවාඩු ලබා ගැනීමට ද නිලධරයාට හැකියාව පවතී.

1. යම් නීතියක් හෝ දෙපාර්තමේන්තු නියමයක් හෝ රෙගුලාසියක් හෝ උල්ලංඝණය වන අයුරින් ක්‍රියා කිරීම නිසා,

   හෝ

2. නිලධරයාගේ සහායක නොසැලකිලිමත්භාවය නිසා නොවිය යුතු ය.

4.2.2 විශේෂ අසනීප නිවාඩු

සත්‍ය වශයෙන්ම රාජකාරි ස්වභාවය හේතු කොට ගෙන නිලධරයාගේ ප්‍රමාද දෝෂයක් නොවන අවස්ථාවලදී වැළඳෙන රෝග සඳහා රජයේ වෛද්‍ය නිලධරයෙකුගෙන් වෛද්‍ය සහතිකයක් මත අදාළ අමාත්‍යාංශ ලේකම්ට මාස 06ක් දක්වා සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු හා ඉන් අනතුරුව මාස 06ක් දක්වා අඩු වැටුප් සහිත නිවාඩු අනුමත කළ හැකි ය. මෙහිදී නිලධරයා වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් නොවේ.

අධ්‍යාපන අනධ්‍යයන
සේවක සංගමය
01 JUN 2022
අලව්වතුගොඩ - මහනුවර

CamScanner

නිලධරයෙකුට තමා කලින් අනුමත කර ගත් නිවාඩුවෙන් කොටසක් අවලංගු කර ගැනීමට ද අවසර දිය හැකි ය.

දිවයිනෙන් බැහැර නිවාඩුවක් ගත කර නැවත මෙරටට පැමිණි නිලධරයෙකු තමා පැමිණි බව පෞද්ගලිකව පෙනී සිටිමින් හෝ ලිපියක් මඟින් අදාළ ලේකම්වරයාට දැනුම්දිය යුතු ය.

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

අධ්‍යාපන අනධ්‍යයන
සේවක සංගමය
JUN 2022
අලවතුගොඩ - මහනුවර
ලි.ප.අ: 6727

4.2.3 අනපේක්ෂිත ව්‍යසනයන් සඳහා ලබාදෙන නිවාඩු

තමා රාජකාරියේ නිරතව නොසිටින අවස්ථාවකදී අනපේක්ෂිත ව්‍යසනයන් නිසා තුවාල ලබන ඉහත දැක්වූ නිලධර ගණවලට අයත් නිලධරයන්ට හෝ පොලිස් නිලධරයෙකුට වෛද්‍ය මණ්ඩල නිර්දේශ අනුව ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය මත විශේෂ නිවාඩු ලබාදිය හැක.

අනපේක්ෂිත ව්‍යසනයක් යනු යම් භූගෝලීය ප්‍රදේශයක් තුළ සිදුවන ගංවතුර, සුළි සුළං, භූමි කම්පා, දීර්ඝ නියං වැනි ස්වාභාවික වශයෙන් හෝ යුධමය අවස්ථාවක ඇති වන ව්‍යසනයන් යන අවස්ථා වේ.

4.3 විශේෂිත රෝග සඳහා විශේෂ නිවාඩු

සේවයේ ස්ථිර නිලධරයෙකුට, මාසික හෝ දෛනික වැටුප් පිට එක් අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කළ තාවකාලික නිලධරයෙකුට, එක් අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කළ අනියම් නිලධරයෙකුට ආයතන සංග්‍රහයේ XXIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන පරිදි වෛද්‍ය මණ්ඩල නිර්දේශ මත පහත පරිදි රෝග අවස්ථාවන් සඳහා විශේෂ නිවාඩු ලබාදිය හැක.

ක්ෂය රෝගය	- වරකට මාස 04 බැගින් කඩින් කඩ දෙවාරයක දී
ලාදුරු රෝගය	- මාස 22කට නොවැඩි කාලයක්
පිළිකා රෝගය	- මාස 06කට නොවැඩි කාලයක් හා අවශ්‍ය නම් තවත් මාස 03

ඉහත රෝගයන්ට සමාන රෝග සඳහා මාස 06ක උපරිමයට යටත්ව හා සැත්කම්වලින් පසු අවශ්‍ය රැක බලා ගැනීම සඳහා මාස 06 උපරිමයක් දක්වා මෙම විශේෂ නිවාඩු ලබා දිය හැකි ය.

මෙම විශේෂ නිවාඩු ලබාදිය යුත්තේ සාමාන්‍ය නිවාඩු විධිවිධානයන් යටතේ නිලධරයාට හිමිවන සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ප්‍රමාණය අවසන් වූ පසු එම නිවාඩු ප්‍රමාණය ද සමඟ ඉහත උපරිම සීමාවන්ට යටත්ව ය. එනම් අදාළ වර්ෂය තුළ ලබා දිය හැකි නිවාඩු හා පෙර වර්ෂයේ ඉතිරි විවේක නිවාඩු නිලධරයා සතුව තිබේ නම් මෙම නිවාඩු කාලසීමාව තුළට එම නිවාඩු ඇතුළත් කර ලබාදිය යුතු ය.

4.4 හිලව් නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 7 වගන්තියෙහි මේ සඳහා විධිවිධාන පවතී. එනම් නිලධරයෙකු රජයේ නිවාඩු දින යන හෝ සතියේ විවේක දිනයක රාජකාරියේ යෙදීම සඳහා තම දෙපාර්තමේන්තු ප්‍රධානියා නියම කරන අවස්ථාවක දී එම දිනයට හෝ එම දිනයේ රාජකාරි කරන ලද්දේ සිය සාමාන්‍ය කාර්යාල වේලාව තුළට ගැනෙන යම් පැය ගණනක් නම් එම ප්‍රමාණය සඳහා හෝ පමණක් එකී නිවාඩු දිනයේ සිට වසරක් ඇතුළත රජයේ වැඩ කරන දිනයක ලබාදෙන නිවාඩුව, හිලව් නිවාඩුවක් ලෙස හැඳින්වේ.

4.5 විශේෂ නිවාඩු

රාජ්‍ය නිලධරයෙකුට අදාළ විධිවිධාන යටතේ හෝ තම පාලනයෙන් බැහැර කරුණු සම්බන්ධයෙන් වන විධිවිධාන මත ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 12 වගන්තියට යටත්ව මෙම විශේෂ නිවාඩු යටතේ හිමි වේ. ආයතන සංග්‍රහයේ පවතින විධිවිධාන මෙන්ම කාලීනව ඇතිවන යම් යම් තත්ත්වයන්හිදී, උදාහරණ ලෙස ගංවතුර, ස්වභාවික විපත්, කලකෝලාහල වැනි අවස්ථාවල දී චක්‍රලේඛ විධිවිධාන මඟින් ද මෙම විශේෂිත නිවාඩු අවස්ථා ලබාදෙන අවස්ථා ඇත. ආයතන සංග්‍රහයේ විධිවිධානවල පවතින පහත අවස්ථා ඒ සඳහා උදාහරණ ලෙස දැක්විය හැක.

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
04 JUN 2022
අලවතුගොඩ - මහනුවර
ලි.ප.අං 6727

- ඉස්ලාම් භක්තික රාජ්‍ය නිලධරයන්ට සිය ආගම ඇදහීම සඳහා මධ්‍යහන 12.00 සිට පැය 02ක කාලයක් ලබා දෙන නිවාඩු
- අධ්‍යයන ශිෂ්‍යත්වලට සහභාගී වීම සඳහා ලබා දෙන නිවාඩු
- මැතිවරණයක ඡන්දය ප්‍රකාශ කිරීමට ලබා දෙන නිවාඩු
- ජාත්‍යන්තර සම්මේලනයකට සහභාගී වීම සඳහා දෙන නිවාඩු
- රාජ්‍ය සේවා ක්‍රීඩා කටයුතු සඳහා ලබා දෙන නිවාඩු
- වෘත්තීය සමිති සාමාජිකයන්ට ලබා දෙන නිවාඩු
- විශේෂ රෝගාබාධ සඳහා ලබා දෙන නිවාඩු
- මුස්ලිම් ජාතික රාජ්‍ය නිලධාරිනියන්ට ඉද්ධා පිළිපැදීම සඳහා දෙන නිවාඩු

4.6 රජයේ විභාගවලට පෙනී සිටීමට නිවාඩු

රාජකාරිමය අවශ්‍යතාවන් මත සම්පූර්ණ කළ යුතු සුදුසුකම් සම්පූර්ණ කිරීම වෙනුවෙන් විභාගවලට මුහුණ දෙන නිලධරයන්ට, එකී විභාග සඳහා පළමු වතාවට පෙනී සිටීමේ දී පමණක් රාජකාරි නිවාඩු ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 19 වගන්තියෙහි විධිවිධානවලට යටත්ව අනුමත කළ හැකි ය. නමුත් එම විභාගය සඳහා සහභාගී වීම වෙනුවෙන් ගමන් වියදම් දීමනා හෝ සංයුක්ත දීමනා ලබා ගැනීමට නිලධරයාට කිසිදු හිමිකමක් නොමැත.

4.7 අනිවාර්ය නිවාඩු

යම් නිලධරයෙකු සිය නිලයේ රාජකාරි කටයුතු කරගෙන යාම පොදු යහපත පිණිස හේතු නොවේ යැයි වෛද්‍ය නිර්දේශය මත හෝ වෙනත් විශේෂ හේතු මත සලකන අවස්ථාවලදී පත් කිරීම් බලධරයාට, එම නිලධරයා අනිවාර්ය නිවාඩු යැවිය හැකි ය. මේ සම්බන්ධ විධිවිධාන ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 20 වගන්තියෙහි දැක්වේ. එසේ ලබාදෙන අනිවාර්ය නිවාඩු පළමුව නිලධරයාගේ ඉතිරි නිවාඩුවලින් අඩු කරන අතර ඔහුගේ නිවාඩු අවසන් වූ පසු ඉතිරි නිවාඩු සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙස සැලකිය යුතු ය.

4.8 අඩ වැටුප් සහිත නිවාඩු

රජයේ නිලධරයෙකුට සිය සාමාන්‍ය විවේක නිවාඩු අවසන් වීමෙන් පසුව වෛද්‍ය හේතුන් මත වන අවශ්‍යතාවක් හේතුවෙන් පහත විධිවිධානවලට යටත්ව අඩ වැටුප් සහිත නිවාඩු ලබා දිය හැකි ය. මේ සම්බන්ධ විධිවිධාන ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 21 වගන්තිය යටතේ සඳහන් වේ.

- ලබා ගත හැකි උපරිම අඩ වැටුප් සහිත නිවාඩු ප්‍රමාණය සිය සේවා කාලයෙන් 1/6කි.
- වරකට උපරිමය මාස 12ක කාල සීමාවකි.

එසේ වුවද මාණ්ඩලික නිලධරයෙකුට ඉහත මූලික විධිවිධානයන්ට පරිබාහිරව අඩ වැටුප් සහිත නිවාඩු විශේෂිත ආකාරයකට භාවිත කිරීමට අවස්ථාව සලසා දී ඇත. එනම් දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩුවල දී මාණ්ඩලික නිලධරයෙකුට වෛද්‍ය හේතු මත නොවන අවස්ථාවක දී වුවද මෙම අඩ වැටුප් සහිත නිවාඩු භාවිත කළ හැකි ය. එමෙන්ම එම සම්පූර්ණ අඩ වැටුප් නිවාඩු ප්‍රමාණය හෝ ඉන් කොටසක් සම්පූර්ණ වැටුප් සහිතව, පරිවර්තිත අඩ වැටුප් නිවාඩු ලෙස අඩ වැටුප් සහිත නිවාඩු ප්‍රමාණයෙන් භාගයකට පරිවර්තනය කර ගැනීමේ හැකියාවක් පවතී. එමෙන්ම දිවයින තුළ ගත කරන නිවාඩු සඳහා පරිවර්තිත අඩ වැටුප් නිවාඩු භාවිත කරන්නේ නම තමාට හිමි විවේක නිවාඩු හා පරිවර්තිත අඩ වැටුප් නිවාඩුවල මුළු එකතුව මාස 03ක උපරිමයකට යටත් වේ.

අඩ වැටුප් ලබා ගන්නා නිලධරයෙකුට ලබාදිය හැක්කේ තමාට පෞද්ගලිකව දෙනු ලබන දීමනාවලින් ද හරි අඩක් පමණි. එමෙන්ම සේවා කාලය ලෙස ගණන් ගැනෙනුයේ ද අඩ වැටුප් සහිත නිවාඩු කාලපරිච්ඡේදයෙන් හරි අඩක් පමණි. අඩ වැටුප් සහිත නිවාඩු කාලය තුළට වැටෙන සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින ද අඩ වැටුප් දින ලෙස සැලකේ.

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022

CamScanner

ඒ අනුව පරිවර්තිත අඩවැටුප් නිවාඩු ලබා ගැනීමක දී හැර නිලධරයෙකු විසින් ලබා ගන්නා අඩ වැටුප් සහිත නිවාඩුවකින් ඔහුට මූල්‍යමය වශයෙන් මෙන්ම සේවා කාලය ගණනය කිරීමේදී ද බලපෑමක් සිදු වන බව අවබෝධ කරගත හැකි ය.

4.9 වැටුප් රහිත නිවාඩු

සාමාන්‍ය විධිවිධාන යටතේ ඉතා හදිසි පෞද්ගලික හේතු නිසා හෝ රජයේ වෛද්‍ය නිලධරයෙකුගේ වෛද්‍ය සහතිකයක් මඟින් සනාථ කරන සෞඛ්‍ය හේතු මත දිවයිනේ ගත කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි රාජ්‍ය නිලධරයෙකුට මාස 03ක උපරිම කාලය සඳහා වැටුප් රහිත නිවාඩු ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 22 වගන්තිය යටතේ ලබා දිය හැකි ය. අතිවිශේෂ අවස්ථාවල දී අදාළ ලේකම්වරයාගේ අනුමතිය මත දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා ද මෙම වැටුප් රහිත නිවාඩු ලබා දිය හැකි ය.

මෙම වැටුප් රහිත නිවාඩුව ලබා දෙනුයේ සෞඛ්‍ය හේතු මත නම් එසේ ලබා දිය යුත්තේ නිලධරයාට ඉතිරිව ඇති සම්පූර්ණ වැටුප් සහිත සහ අඩ වැටුප් සහිත නිවාඩු අවසන් වූ පසුව වන අතර හදිසි පෞද්ගලික හේතු මත ලබා දෙන්නේ නම් සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු අවසන් වූ පසු ලබා දිය යුතු ය. මෙම වැටුප් රහිත නිවාඩුව පෞද්ගලික අධ්‍යයන කටයුතු සඳහා කිසිවිටක හෝ ලබා දිය නොහැකි ය.

ඉහත විධිවිධානයන්ගෙන් ඔබ්බට රාජ්‍ය නිලධරයෙකුට සිය කලත්‍රයාගේ හෝ දරුවෙකුගේ අසනීපයක් වෙනුවෙන් වසරක උපරිමය දක්වා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේ හැකියාව මෙන්ම මද සරු භාවය සඳහා ප්‍රතිකාර ලබා ගන්නා රාජ්‍ය නිලධාරිනියන්ට උපරිමය වසරක කාලයක් දක්වා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේ හැකියාව ද පවතී. මෙසේ ලබා දෙන වැටුප් රහිත නිවාඩු කාලසීමාව වැටුප් වර්ධක කාර්යයන් සඳහා හෝ සක්‍රිය සේවා කාලය ගණනය සඳහා හෝ විශ්‍රාම වැටුප් කාර්යය සඳහා හෝ ගණනය කරනු නොලැබේ.

5. අධ්‍යයන සහ/හෝ රැකියා සඳහා නිවාඩු

රාජ්‍ය නිලධරයන්ට මෙරට සිය අධ්‍යයන කටයුතු සඳහා මෙන්ම දිවයිනෙන් බැහැර අධ්‍යයන හා/හෝ රැකියා සඳහා නිවාඩු ලබා දීමේ විධිවිධාන ආයතන සංග්‍රහයේ ඇතුළත්ව පවතී. මෙකී නිවාඩු අවස්ථාවෝචිතව සම්පූර්ණ වැටුප් සහිතව හෝ වැටුප් රහිතව ලබා ගැනීමේ අවකාශ රාජ්‍ය නිලධරයන් සතු වේ. මෙකී අධ්‍යයන සහ/හෝ රැකියා සඳහා නිවාඩු ලබා දෙන ආකාරය, ඊට අදාළ කොන්දේසි, ලබා ගැනීමේ සුදුසුකම් පිළිබඳ වෙන් වෙන් වශයෙන් සලකා බැලීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ. මේ සම්බන්ධ විධිවිධාන මූලිකවම කොටස් 03ක් යටතට වර්ගීකරණය කළ හැකි ය.

I. සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු (ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 14 වගන්තිය)
II. වැටුප් රහිත මෙරට අධ්‍යයන නිවාඩු (ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 15 වගන්තිය)
III. විදේශ අධ්‍යයන සහ/හෝ රැකියා සඳහා නිවාඩු (ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය)

5.1 සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු

අධ්‍යයන හෝ අභ්‍යාස කාල පරිච්ඡේදය සහ ගමන් කිරීමට අවශ්‍ය අඩුම කාල පරිච්ඡේදය සඳහා රාජ්‍ය නිලධරයෙකුට මෙරට දී හෝ විදේශයක දී සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දීමේ විධිවිධාන ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 14 වගන්තිය යටතේ අන්තර්ගත වේ. එකී අධ්‍යයන නිවාඩු ලබා ගත හැකි කාර්යයන් කිහිපයකි.

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022
අලව්තුගොඩ - මහනුවර

CamScanner

1. රජයේ වියදමින් නියමිත සුදුසුකම් ලබා ගැනීම සඳහා අනුමත කරන ලද දෙපාර්තමේන්තු අභ්‍යාස ක්‍රමයක් හෝ ශිෂ්‍යත්ව ක්‍රමයක් යටතේ නිලධරයෙකු තෝරා ගෙන ඇති විට
2. ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 1:5:3 උප වගන්තියට අනුව රජයේ ඉල්ලීම පිට ලබා ගත් ශිෂ්‍යත්වයක් මත නිලධරයෙකු යවන විට
3. සිය තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාව, බඳවා ගැනීමේ/උසස් කිරීමේ පරිපාටියට අනුව අධ්‍යයන/අභ්‍යාස පාඨමාලාවක් සඳහා ආණ්ඩුවේ හෝ විදේශීය ආණ්ඩුවක නැතහොත් ඒජන්සියක වියදමින් නිලධරයා පිටරට යවන විට
4. දෙපාර්තමේන්තුවේ අභ්‍යාස වැඩ පිළිවෙළට ඇතුළත් වී ඇත්තා වූ ද, නිලධරයෙකුගේ වෘත්තීය කාලයේ යම් අවධියක දී හැදෑරීම සඳහා ස්ථිර පරිදි රජයේ වියදමින් ඔහු පිටරට යැවිය යුතුව තිබුණා වූ ද, අධ්‍යයන හෝ අභ්‍යාස පාඨමාලාවක් සඳහා විදේශීය ඒජන්සියකින් හෝ විදේශීය ආණ්ඩුවකින් පිරිනැමෙන ශිෂ්‍යත්වයක් ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 1:5:1 හෝ 1:5:2 උප වගන්තිවලට අනුව ඔහුගේම උත්සාහයෙන් ලබා ගත් විට
5. විදේශීය ආණ්ඩුවකින් හෝ ඒජන්සියකින් හෝ මෙහෙයවන සම්මන්ත්‍රණයක්, අභ්‍යාස වැඩ පිළිවෙළක්, ශිල්පීය අභ්‍යාස පාඨමාලාවක්, වෘත්තීය උපදේශක පාඨමාලාවක්, අධ්‍යයන චාරිකාවක් යනාදියට සහභාගි වීමට; එහෙත් ඒ සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දිය හැක්කේ අදාළ ආරාධනය කර ඇත්තේ ශ්‍රී ලංකා රජය වෙත නම් ද, ඒ සඳහා සහභාගි වීමට රජය විසින් එම නිලධරයා නම් කර ඇත්තේ නම් ද පමණකි.

තාවකාලික නිලධරයන්ට සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට හිමිකමක් නොමැති අතර පරිවාස කාලයේ සිටින නිලධරයෙකුට සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පරිපාටියේ හෝ උසස් කිරීමේ පරිපාටියේ හෝ අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස අධ්‍යයන කටයුත්තක් හෝ අභ්‍යාස කටයුත්තක් දක්වා ඇති අවස්ථාවක දී පමණක් එකී අධ්‍යයනයට හෝ අභ්‍යාසයකට දිවයිනෙන් බැහැර සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලබා දිය හැකි ය.

මේ ආකාරයට ලබා දෙන සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුව වෙනුවෙන් එකී නිවාඩුව අවසානයේ නැවත සේවයට වාර්තා කළ පසු නිලධරයා අනිවාර්යය සේවා කාලයක් රජය වෙනුවෙන් සේවය කිරීමට යටත් වන අතර, මෙම නිවාඩුව ලබා ගැනීම වෙනුවෙන් ඔහු ගිවිසුමකට හා බැඳුම්කරයකට යටත් වේ.

5.1.1 මෙරටින් බැහැර සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක දී අනිවාර්ය සේවා කාලය

- නිවාඩු කාලය මාසයකට අඩු අවස්ථාවන්වල දී අනිවාර්ය සේවා කාලයක් නියම නොවේ.
- නිවාඩු කාලය මාසයක් හෝ ඊට වැඩි කාල පරිච්ඡේදයක් නම් ඒ සඳහා නිවාඩු කාලය මෙන් හතර ගුණයකි.
- අනිවාර්ය සේවා කාලය අඩුම වශයෙන් එක් වර්ෂයකට සහ උපරිම වශයෙන් වර්ෂ 10කට සීමා වන අතර, ආසන්න සම්පූර්ණ මාසයට ගණන් බැලිය යුතු ය.

5.1.2 මෙරට සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක දී අනිවාර්ය සේවා කාලය

- නිවාඩු කාලය මාස 06කට අඩු අවස්ථාවන් සඳහා අනිවාර්ය සේවා කාලයක් නියම නොවේ.
- නිවාඩු කාලය මාස 06ක් හෝ ඊට වැඩි නම් වර්ෂ 05ක උපරිමයකට යටත්ව නිවාඩු කාලය මෙන් දෙගුණයකි.
- අනිවාර්ය සේවා කාලය ආසන්න සම්පූර්ණ මාසයට ගණන් බැලිය යුතු ය.

5.2 වැටුප් රහිත මෙරට අධ්‍යයන නිවාඩු

වැටුප් රහිත මෙරට අධ්‍යයන නිවාඩුව ලබා ගත හැක්කේ රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් ලබා ඇති රාජ්‍ය නිලධරයෙකුට පමණි. එකී නිවාඩු අනුමතිය ලබා දීමට පෙර එකී අධ්‍යයනය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතු කරුණු කිහිපයකි. එනම්

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022

CamScanner

දෙන අවස්ථාවක දී ඉහත සඳහන් කළ ගිවිසුමට අමතරව බැඳුම්කරයකට යටත් කරනු ලැබේ. පරිවාස කාලය තුළ සිටින නිලධරයෙකුට මෙම නිවාඩුව ලබා දීමේදී නිවාඩු කාල සීමාවට සමාන කාලයකින් ඔහුගේ/ ඇයගේ පරිවාස කාලය දීර්ඝ කළ යුතු ය.

5.3.3 විදේශ රැකියා සහ අධ්‍යයන නිවාඩු

රාජ්‍ය සේවයේ ස්ථිර කරනු ලැබූ රජයේ නිලධරයෙකුට උපරිමව වර්ෂ 05කට යටත්ව විදේශ රැකියා සහ අධ්‍යයන නිවාඩු හෝ එහි ප්‍රතිලෝමය ලෙස නිවාඩු ලබා දීමට විධිවිධාන පවතී. අනිවාර්ය සේවා කාලය ඉහත නිවාඩුවල දී මෙන්ම නිවාඩු කාලසීමාව මෙන් දෙගුණයකි. නිවාඩුව ලබා ගැනීමට පෙර ආයතන සංග්‍රහයේ 11 පරිශිෂ්ටය පරිදි රජය සමඟ ගිවිසුමකට නිලධරයා එළඹිය යුතු ය.

5.3.4 විදේශ අධ්‍යයනයේ නියුතු කලත්‍රයා සමඟ විදේශගත වීම සඳහා නිවාඩු

විදේශ ශිෂ්‍යත්ව මත උසස් අධ්‍යාපනය සඳහා විදේශගතවන රාජ්‍ය සේවයේ නියුතු කලත්‍රයාම ද අදාළ නිලධරයා සමඟ විදේශගත වීම සඳහා මෙම නිවාඩුව ලබා දෙන අතර ඒ සඳහා විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීමේ දී අදාළවන ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තියේ කොන්දේසිවලට යටත්ව මෙම නිවාඩුව ලබා දේ. එසේම විදේශ ශිෂ්‍යත්ව සඳහා සන්නද්ධ සේවාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක නිලධරයෙකු නිල වශයෙන් තෝරාගෙන විදේශයකට යවන අවස්ථාවක දී එකී නිලධරයාගේ කලත්‍රයා රාජ්‍ය නිලධරයෙකු වන්නේ නම් ඔහුට හෝ ඇයට ද මෙම විධිවිධාන අදාළ කරගත හැකි ය. මෙහි දී නිලධරයා 33 වන පරිශිෂ්ටය පරිදි ගිවිසුමකට එළඹිය යුතු ය.

වැටුප් රහිත මෙරට/ මෙරටින් බැහැර අධ්‍යයන හා/හෝ රැකියා සඳහා නිවාඩු පිළිබඳ විධිවිධාන පහත පරිදි සාරාංශ කර දැක්විය හැක.

අධ්‍යයන හා/හෝ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු

- **විදේශ අධ්‍යයන හා/හෝ රැකියා සඳහා නිවාඩු** (XII පරිච්ඡේදයේ 16 වගන්තිය අනුව)
  - **විදේශ රැකියා සඳහා නිවාඩු**
    - සේවයේ ස්ථිර විය යුතු ය.
    - උපරිමය අවුරුදු 05කි.
    - අනිවාර්ය සේවා කාලය නිවාඩුව මෙන් දෙගුණයකි.
    - 10 වන පරිශිෂ්ටය අදාළ වේ.
  - **විදේශ අධ්‍යයන නිවාඩු**
    - සේවයේ ස්ථිර,ස්ථිර කරනු නොලැබූ හෝ තාවකාලික නිලධරයෙකුට ලබා දිය හැක.
    - උපරිමය අවුරුදු 03කි.
    - අනිවාර්ය සේවා කාලය නිවාඩුව මෙන් දෙගුණයකි.
    - 09 වන පරිශිෂ්ටය අදාළ වේ.
  - **විදේශ අධ්‍යයන හා රැකියා සඳහා නිවාඩු**
    - සේවයේ ස්ථිර විය යුතුය.
    - උපරිමය අවුරුදු 05කි.
    - අනිවාර්ය සේවා කාලය නිවාඩුව මෙන් දෙගුණයකි.
    - 11 වන පරිශිෂ්ටය අදාළ වේ.
- **මෙරට අධ්‍යයන නිවාඩු** (XII පරිච්ඡේදයේ 15වගන්තිය අනුව)
  - ස්ථිර නිලධරයෙකු විය යුතුය.
  - වරකට වසර බැගින් උපරිමය වසර 03කි.
  - අනිවාර්ය සේවා කාලය
    - නිවාඩු කාලය වර්ෂයකට අඩු නම් අනිවාර්ය සේවා කාලයක් නැත.
    - වර්ෂයක් හෝ ඊට වැඩි නම් නිවාඩු කාලයට සමාන කාලයකි.
  - 09 වන පරිශිෂ්ටය අදාළ වේ.

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022

I. නිලධරයා යෝජිත පාඨමාලාව හැදෑරීමට සමත් බව
II. එය ඔහුගේ කාර්ය ක්ෂේත්‍රයට අදාළ බව
III. සිය රාජකාරි ඉටු කිරීමේ දී එය ඔහුට ප්‍රයෝජනවත් බව

මෙහි දී ලබා දිය හැකි උපරිම නිවාඩු කාලය වර්ෂ 03ක් පමණක් වන අතර පළමුව එක් වර්ෂයකට ද ඉන් අනතුරුව අවස්ථාවෝචිතව වර්ෂය බැගින් එය දීර්ඝ කිරීමට ද යටත් වේ. මෙකී නිවාඩුව වර්ෂයකට අඩු නම් අනිවාර්ය සේවා කාලයක් නියම නොවන අතර වර්ෂයක් හෝ ඊට වැඩි නම් නිවාඩු කාලයට සමාන අනිවාර්ය සේවා කාලයකට නිලධරයා යටත් වේ. නිවාඩුව ලබා ගැනීමේ දී ආයතන සංග්‍රහයේ 9 පරිශිෂ්ටය පරිදි ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

5.3 විදේශ අධ්‍යයන සහ/හෝ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තියෙහි මෙම නිවාඩු සම්බන්ධ විධිවිධාන ඇතුළත් වේ. මෙහි දී මූලිකව අවබෝධ වන කරුණ වනුයේ රැකියා සඳහා ලබා දෙන වැටුප් රහිත නිවාඩුව මෙරටින් බැහැර රැකියා සඳහා පමණක් අදාළ වන බවත් මෙරට දී රැකියා සඳහා නිවාඩු ලබා ගැනීමේ විධිවිධාන ආයතන සංග්‍රහයේ ඇතුළත්ව නොමැති බවත් ය. එසේවුව ද රජයේ එකඟතාව ඇතිව ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළ, ලෝක සෞඛ්‍ය සංවිධානය ආදී විදේශ නියෝජිත ආයතනයන්හි රැකියාවක් කිරීම සඳහා හෝ රජයේ අනුමතිය ඇතිව විදේශ අරමුදල් යොදවා, අමාත්‍යාංශ යටතේ ඇති ව්‍යාපෘතිවල රැකියාවක් කිරීම සඳහා මෙම විධිවිධාන යටතේ නිවාඩු ලබා ගැනීමේ හැකියාව පවතී.

මෙම වගන්තිය යටතේ ලබා දෙන නිවාඩු කාලය විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා ගණන් ගැනීමේ හැකියාව නොමැති අතර වැටුප් රහිත නිවාඩු කාල සීමාව තුළ ඇති වන කිසිඳු පුරප්පාඩුවකට උසස් කිරීම සඳහා ද සලකා බැලිය නොහැක. කෙසේ වෙතත් නිවාඩු කාල සීමාව තුළ නිලධරයා පිළිබඳ කිසිඳු අහිතකර වාර්තාවක් ඉදිරිපත් වී නොමැති අවස්ථාවක දී පමණක් ඔහු අදාළ වැටුප් පියවරෙහි පිහිටුවීම සඳහා මෙසේ නිවාඩු ලබා ගත් කාලසීමාව අදාළ කර ගත හැකි ය.

එමෙන්ම මෙම නිවාඩු ලබා දීම වෙනුවෙන් නිලධරයා නිවාඩු කාලසීමාව මෙන් දෙගුණයක කාලයක් සඳහා අනිවාර්ය සේවා කාලයකට යටත් වන අතර ඔහු වැටුප් රහිත නිවාඩුව ආරම්භ කරන අවස්ථාව වන විට නිම කර ඇති වැටුප් රහිත නිවාඩු නොලැබූ සම්පූර්ණ එක් එක් වර්ෂය වෙනුවෙන් එක් මාසයක් බැගින් එසේ නියම වන අනිවාර්ය සේවා කාලයෙන් අඩු කළ හැකි ය. කෙසේ වෙතත් අවම අනිවාර්ය සේවා කාලය වර්ෂයක් විය යුතු ය.

මෙම වගන්තියේ දැක්වෙන විධිවිධාන අධ්‍යයන පහසුව පිණිස පහත උප කොටස් 03 යටතේ වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කළ හැක.

5.3.1 විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු

මෙකී නිවාඩුව ලබා දිය හැක්කේ සේවයේ ස්ථිර කරන ලද රාජ්‍ය නිලධරයෙකුට පමණි. උපරිමව වර්ෂ 05කට නිවාඩු ලබා දිය හැකි අතර අනිවාර්ය සේවා කාලය නිවාඩු කාල සීමාව මෙන් දෙගුණයකි. නිලධරයා නිවාඩුව ලබා ගැනීමේ දී ආයතන සංග්‍රහයේ 10 පරිශිෂ්ටයේ පරිදි රජය සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

5.3.2 විදේශ අධ්‍යයන සඳහා වැටුප් රහිත නිවාඩු

රජයේ ස්ථිර, ස්ථිර කරනු නොලැබූ හෝ තාවකාලික නිලධරයෙකුට මෙකී නිවාඩුව ලබා දීමට හැකියාව පවතී. ලබා දිය හැකි උපරිම කාලසීමාව වසර 03කි. අනිවාර්ය සේවා කාලය නිවාඩු කාලසීමාව මෙන් දෙගුණයක් වේ. මෙකී නිවාඩුව ලබා ගැනීමේ දී ආයතන සංග්‍රහයේ 09 පරිශිෂ්ටය පිරිදි රජය සමඟ ගිවිසුමකට නිලධරයා ඇතුළත් විය යුතු අතර සේවයේ ස්ථිර කරනු නොලැබූ නිලධරයෙකුට හෝ තාවකාලික නිලධරයෙකුට මෙකී නිවාඩුව ලබා

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022

CamScanner

6.3 දෛනික වැටුප් ලබන නිලධරයෙකුගේ නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 27 වගන්තිය යටතේ මෙම නිලධර ගණයේ නිවාඩු දක්වා ඇත. වසර 02ක් හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩව සේවය කර ඇති දෛනික වැටුප් ලබන නිලධරයෙකුට නිසි වෛද්‍ය සහතික මඟින් ආවරණය වන අසනීප සඳහා වර්ෂයකට දින 14ක උපරිමයකට යටත්ව සම්පූර්ණ වැටුප් සහිත අසනීප නිවාඩු ලබා දිය හැකි ය. මෙහි සඳහන් උපරිම කාලසීමාවෙන් ඔබ්බට වෛද්‍ය සහතික මත තවදුරටත් නිවාඩු අවශ්‍ය වූ විටෙක කණිෂ්ඨ නිලධරයෙකුට නිවාඩු ලබා දෙන ආකාරයෙන්ම ඉකුත් වර්ෂයේ ඉතිරිව ඇති අසනීප නිවාඩු සහ ඕනෑම වර්ෂ 02ක ඉතිරිව ඇති අසනීප නිවාඩු ඔවුන් සඳහා ද ලබා දිය හැකි ය.

පසුගිය මාස 12 තුළ අවම වශයෙන් දින 250ක් හෝ සේවයට වාර්තා කර ඇති මෙම ගණයේ නිලධරයන්ට දින 21ක අනියම් නිවාඩුවක් වර්ෂය තුළ දී ලබාදිය හැකි ය. එකී දින 250ට වඩා අඩුවන විට එක් එක් දින තුනේ කාලපරිච්ඡේදය වෙනුවෙන් හෝ එක් කොටසක් වෙනුවෙන් එක් දිනක් බැගින් ඉහත අනියම් නිවාඩු දින 21න් නිලධරයාට අහිමි වේ.

6.4 පොලිස් සැරයන්වරු සහ කොස්තාපල්වරුන්ගේ නිවාඩු

මෙම නිලධරයන්ගේ නිවාඩු ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 30 වගන්තිය යටතේ සඳහන් වේ. මෙම නිලධර ගණ සඳහා සාමාන්‍ය රාජ්‍ය නිලධරයෙකුට හිමිවන ආකාරයෙන් විවේක නිවාඩු ලබාගැනීමේ හිමිකම පැවතිය ද අනියම් නිවාඩු ලබාගැනීමේ හිමිකමක් නොමැත.

රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා ඉහත ගණයේ නිලධරයෙකුට, ඔහු අදාළ වර්ෂය තුළ විවේක නිවාඩු කිසිවක් ලබාගෙන නොමැති නම් එක් වර්ෂයක් තුළ සම්පූර්ණ වැටුප් සහිතව මාස 02ක් දක්වා නිවාඩු ලබාදිය හැකි ය. එකී වර්ෂය තුළ ඔහු විවේක නිවාඩු කිසියම් ප්‍රමාණයක් ලබාගෙන තිබුණහොත් එම නිවාඩු ප්‍රමාණය ඔහුට හිමිවන ඉහත මාස 02ක කාල සීමාවෙන් අඩු කළ යුතු වේ.

6.5 ආධුනිකයෙකු සහ අභ්‍යාසලාභියෙකු සඳහා නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 32 වගන්තිය යටතේ මෙම නිලධර ගණයේ නිවාඩු සම්බන්ධ විධිවිධාන සඳහන් වේ. එනම් සිය අධ්‍යයන කාලය තුළ දීමනාවක් ලබන ආධුනිකයෙකුට/ අභ්‍යාසලාභියෙකුට මාස 09ක සේවා කාලය සම්පූර්ණ කළ විට වර්ෂයකට අනියම් නිවාඩු 07ක් සහ අසනීප නිවාඩු 14ක් ලබා දිය හැකි ය. මාස 09කට අඩු අධ්‍යයන කාලයක් සහිත නිලධරයෙකුට කිසිඳු වැටුප් සහිත නිවාඩුවක් ලබා ගැනීමට හිමිකම් නොමැත. එමෙන්ම දේශනවලට සහභාගී වන ආධුනිකයෙකුට/ අභ්‍යාසලාභියෙකුට එකී දේශන වාරය තුළ නිවාඩු ලබා නොදිය යුතු ය.

6.6 අනියම් නිලධරයන් සඳහා නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 33 වගන්තිය යටතේ දැක්වෙන අනියම් නිලධරයන් සඳහා දෛනික වැටුප් ලබන නිලධරයෙකුට හිමිවන අයුරින් අනියම් හා අසනීප නිවාඩු හිමිකම ලැබේ. නමුත් ඔවුන් සඳහා හදිසි අනතුරු නිවාඩු හිමි නොවේ. එසේ වුවත් සිය සේවයේ යෙදී සිටීමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන හදිසි අනතුරක දී තාවකාලික දුබලතාවයකට භාජනය වන නිලධරයෙකුට එම කාල පරිච්ඡේදය සඳහා උපරිම මාස 06කට යටත්ව අඩ වැටුප් නිවාඩු ලබා දිය හැකි ය.

6.7 රාජ්‍ය සංස්ථාවක සේවය සඳහා මුදාහළ නිලධරයෙකුගේ නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 34 වගන්තියෙහි මෙම නිලධරයන්ගේ නිවාඩු සම්බන්ධ විධිවිධාන සඳහන් වේ. රාජ්‍ය සංස්ථාවක සේවය සඳහා මුදාහළ මෙකී නිලධරයෙකුට එම සංස්ථාවේ සේවය කරන

අධ්‍යාපන අනධ්‍යයන
සේවක සංගමය
01 JUN 2022

6. විශේෂිත නිලධර ගණ සඳහා නිවාඩු

රාජ්‍ය නිලධරයන් සඳහා පොදුවේ පවතින නිවාඩු විධිවිධාන සම්බන්ධයෙන් මේ දක්වා අප අවධානය යොමු කරන ලදී. එසේ වුවත් රාජ්‍ය සේවය තුළ නිවාඩු විධිවිධාන වෙන්ව බලපාන විශේෂිත නිලධර කාණ්ඩ කිහිපයක් සම්බන්ධයෙන් සාකච්ඡා කළ හැකි ය. එහි නිලධර කාණ්ඩවල සමාන්‍ය විධිවිධානවලින් බැහැර වන අවස්ථා සම්බන්ධයෙන් පමණක් පහත පරිදි වෙන් වෙන්ව සලකා බැලිය හැකි ය.

6.1 ගුරුවරුන් සඳහා නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 24 වගන්තියෙහි දැක්වෙන මෙම නිවාඩුවල දී ගුරුවරුන් සඳහා අනියම් නිවාඩු සම්බන්ධයෙන් සාමාන්‍ය රාජ්‍ය නිලධරයෙකුට පවතින විධිවිධාන හා සමාන විධිවිධාන පැවතිය ද විවේක නිවාඩු ලබා ගැනීමේ දී විශේෂිත වූ විධිවිධාන ක්‍රියාත්මක වේ. ඊට ප්‍රධානතම හේතුව වනුයේ සාමාන්‍ය රාජ්‍ය නිලධරයන්ට නොමැති විශේෂ වරප්‍රසාදයක් වන පාසල් දරුවන්ගේ නිවාඩු කාල සීමාව ද ඔවුන් සඳහා ප්‍රායෝගිකව නිවාඩු ලෙස ලැබෙන බැවිනි. ඒ අනුව ගුරුවරුන්ට සාමාන්‍යයෙන් විවේක නිවාඩු ලබාගත හැක්කේ ඉහත සඳහන් කළ පාසල් නිවාඩු කාලවල දී පමණි.

දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා ගුරුවරයෙකුට නිවාඩු ලබාදෙන විට එම නිවාඩු කාල තුළට වැටෙන පාසල් නිවාඩු කාලවල මුළු එකතුව එම නිවාඩුව ආරම්භ වී දස මසක් ඇතුළතට වැටෙන පාසල් නිවාඩු කාලවල මුළු එකතුව යන කාල දෙකෙන් අඩු කාලයට සමාන කාලයක් අඛණ්ඩව හිති කාල පරිච්ඡේදයක් වශයෙන් පමණක් සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙස ලබා දිය හැකි ය.

ගුරුවරයෙකුට පාසල් වාරය තුළ දී සාමාන්‍යයෙන් ලබා දෙන අනියම් නිවාඩු අවසන් වූ පසු තවදුරටත් නිවාඩු ලබා දීම අවශ්‍ය වන්නේ නම් ඕනෑම එක් වර්ෂයක දී උපරිම වශයෙන් එක් මාසයක් දක්වා සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලබා දිය හැක. එමෙන්ම එකී නිවාඩු ප්‍රමාණයට අමතරව අසනීපයක් නිසා තවදුරටත් පාසල් වාරය තුළ නිවාඩු ලබා දීමට අවශ්‍ය වුවහොත් ඉහත පරිදි වර්ෂය තුළ මාසයක් දක්වා ලබා දෙන නිවාඩුවලින් ඉතිරිව තිබෙන ඕනෑම අනුගාමී වර්ෂ දෙකක නිවාඩු දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමතිය පරිදි ලබා දිය හැකි ය. ගුරුවරුන්ට ඉකුත් නිවාඩු ලබාගැනීමට හිමිකමක් නොමැත.

6.2 කණිෂ්ඨ නිලධරයන් සඳහා නිවාඩු

ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 26 වගන්තිය යටතේ මොවුන්ගේ නිවාඩු සාකච්ඡා කෙරේ. සාමාන්‍යයෙන් කණිෂ්ඨ නිලධරයෙකුට වර්ෂයක දී සම්පූර්ණ වැටුප් සහිත දින 24ක අසනීප නිවාඩු ලබා දිය හැකි ය. තවදුරටත් අසනීපයක් වෙනුවෙන් ඉහත නිවාඩු ප්‍රමාණයට අමතරව නිවාඩු අවශ්‍ය වන්නේ නම් ඔවුන් සඳහා ඉකුත් වර්ෂයේ ඉතිරිව ඇති අසනීප නිවාඩු සහ ඕනෑම වර්ෂ 02ක ඉතිරිව ඇති ඉකුත් අසනීප නිවාඩු එක් වර්ෂයක් තුළ දී ලබා දිය හැකි ය. එහෙත් අනෙකුත් ශ්‍රේණිවල රාජ්‍ය නිලධරයන් සඳහා ලබා දෙන ආකාරයට එකී වර්ෂය තුළ දෙවන වතාවට ඉකුත් අසනීප නිවාඩු ලබා ගැනීමට කණිෂ්ඨ නිලධරයෙකුට හිමිකමක් නොමැත.

කණිෂ්ඨ නිලධරයෙකුට වර්ෂයක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන තෙක් අනියම් නිවාඩු ලැබීමට හිමිකමක් නොමැත. වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩව සේවය කර ඇති කණිෂ්ඨ නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි වර්ෂයකට අනියම් නිවාඩු දින 21ක් දක්වා නිවඩු ලබාදිය හැකි ය.

වර්ෂ 5ක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා සේවය කර ඇති කණිෂ්ඨ නිලධරයෙකුට වෛද්‍ය සහතික මගින් සනාථ කෙරෙන අසනීප වෙනුවෙන් වැටුප් සහිතව ලබාගත හැකි සියලු නිවාඩු අවසන් වූ පසු ඕනෑම එක් වර්ෂයක දී මාසයක උපරිමයකට යටත්ව අඩ වැටුප් සහිත නිවාඩු දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි ලබා දිය හැක. ඒ අනුව මොවුන් සඳහා අනෙකුත් නිලධර ශ්‍රේණිවල රාජ්‍ය නිලධරයෙකු හිමිකම් ලබන ආකාරයෙන් සිය සේවා කාලයෙන් 1/6ක් දක්වා අඩ වැටුප් සහිත අසනීප නිවාඩු ලබා ගැනීමේ හිමිකමක් නොමැත.

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
01 JUN 2022

CamScanner

පරිච්ඡේදයේ 10 වගන්තියේ සඳහන් ඉකුත් නිවාඩු දිවයිනෙන් බැහැර ගත කිරීමේ කටයුතු සඳහා අදාළ කර ගත නොහැක.

7.2 යටත් නිලධරයන්ට දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා නිවාඩු

යටත් නිලධරයන්ට දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා නිවාඩු අනුමත කිරීමේ දී ඉහත මාණ්ඩලික නිලධරයන් සඳහා අදාළ කර ගත් පරිදි වර්ෂ 03ක විවේක නිවාඩු හෝ පරිවර්තිත අඩ වැටුප් නිවාඩු අදාළ කර ගත නොහැක.

විශේෂ හේතු ඉදිරිපත් කර ඇති විට ඔවුන් සඳහා අදාළ කර ගත හැක්කේ පවත්නා වර්ෂයේ හා ඊට කලින් වර්ෂයේ විවේක නිවාඩු සහ නිසි වෛද්‍ය සහතික මඟින් සනාථ කෙරෙන අසනීප අවස්ථාවල දී ඉකුත් නිවාඩු ද පමණි.

7.3 කණිෂ්ඨ නිලධරයෙකුට දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා නිවාඩු

කණිෂ්ඨ නිලධරයන් මාණ්ඩලික ශ්‍රේණිය හෝ යටත් ශ්‍රේණි නිලධරයන් මෙන් විවේක නිවාඩු සඳහා හිමිකම් නොලබන බව මුල් පරිච්ඡේදවල දී සඳහන් කර ඇත. ඒ අනුව කණිෂ්ඨ නිලධරයෙකුට සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙස දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා ලබා දිය හැක්කේ පවත්නා වර්ෂයේ ඉතිරි අසනීප නිවාඩු සහ පෙර වර්ෂයේ ඉතිරි අසනීප නිවාඩු පමණි.

7.4 විදේශ නිවාඩු අනුමතියක දී පවතින සීමා

රාජ්‍ය නිලධරයෙකුට ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 23 වගන්තිය යටතේ දිවයිනෙන් බැහැර නිවාඩු අනුමත කිරීමේ දී පළමු පත්වීම් දිනයේ සිට වර්ෂ 04ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය. එසේ වුව ද එම සේවා කාලයට අඩු සේවා කාලයක් ඇති නිලධරයෙකුට වුව ද අසනීපයක් නිසා හෝ ඉතා හදිසි පෞද්ගලික හේතුවක් නිසා නිවාඩු අවශ්‍ය බවට නිවාඩු දෙන බලධරයා සෑහීමකට පත්වන්නේ නම් දිවයිනෙන් බැහැර නිවාඩු අනුමත කිරීමේ හැකියාව පවතී.

එමෙන්ම මෙම වගන්තිය යටතේ නිවාඩු ලබා හෝ නැවත සේවයට වාර්තා කළ නිලධරයෙකුට එසේ නැවත සේවයට වාර්තා කළ දින සිට අවම වශයෙන් වසර 04ක සේවා කාලයක් සම්පූර්ණ කරන තෙක් නැවත මෙම වගන්තිය යටතේ දීර්ඝ නිවාඩුවක් අනුමත කළ නොහැක. දීර්ඝ නිවාඩුවක් යන්නෙන් අර්ථකතනය වන්නේ එක් එක් නිලධර ගණයට ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 23 වගන්තිය යටතේ එකවර වැටුප් සහිතව සහ අඩ වැටුප් සහිතව ලබා ගැනීමට හිමිකම ඇති උපරිම නිවාඩු දින ගණන වේ.

7.5 දිවයිනෙන් බැහැර නිවාඩු අනුමතිය ලබා ගන්නා නිලධරයෙකුගේ වගකීම

දිවයිනෙන් බැහැර නිවාඩු අනුමතිය ලබා ගන්නා නිලධරයෙකුට කිසිදු විටක එකී නිවාඩුව හෝ ඉන් කොටස් මෙරට දී ගත කිරීමේ හැකියාවක් නොමැත. ඒ අනුව නිලධරයා නියමිත රටට පැමිණි පසු ඒ බව ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලය හෝ නිසි බලධරයා මඟින් තමන්ගේ ලිපිනය මෙරටට දැනුම් දිය යුතු ය. යම් කිසි ආකාරයක නිවාඩු කාල සීමාවක් තුළ එකී ලිපිනය වෙනස් වන්නේ නම් වහාම ඒ බව ද ඉහත පරිදි දැනුම්වත් කළ යුතු ය.

එමෙන්ම ඔහු නිවාඩුපිට විදේශයක දී සිටින විට සතියක් හෝ ඊට වැඩි කාලයක් අසනීප වුවහොත් ඒ බව දූත මණ්ඩල කාර්යාල හෝ නිසි බලධරයා මඟින් දැනුම් දිය යුතු ය. ඒ ආකාරයේ කලින් බලාපොරොත්තු විය නොහැකි හදිසි අවස්ථාවල දී හැර, නිවාඩු දීර්ඝ කිරීමක් සඳහා අයදුම් කරන බවට නිවාඩු අනුමත කරන බලධරයාගේ එකඟතාව දිවයිනෙන් බැහැර යාමට පෙර අදාළ නිලධරයා විසින් ලබා ගෙන ඇත්නම් මිස, දිවයිනෙන් බැහැර නිවාඩු දීර්ඝ නොකළ යුතු ය. අසනීපයක් හැර වෙනත් කරුණක් හේතුවෙන් නිවාඩු දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටින විටක නිලධරයාට දිගින් දිගටම සේවයට නොපැමිණ සිටීමට පහසුවෙන් ඉඩ දිය හැකි නම් මිස ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 21 වගන්තිය යටතේ අඩ වැටුප් සහිත නිවාඩු ලබා නොදිය යුතු ය.

අධ්‍යාපන අනධ්‍යයන
සේවක සංගමය
01 JUN 2022

CamScanner

කාලසීමාව තුළ ආයතන සංග්‍රහයේ විධිවිධාන යටතේ නිවාඩු ලබාගැනීමට හිමිකමක් නොමැත. ඔහු එම සංස්ථාවේ සේවය කර සංස්ථාවේ නිවාඩු ව්‍යවස්ථා අනුව නිවාඩු උපයාගත යුතු අතර සංස්ථාවේ සේවයට යාමට පෙර රාජ්‍ය සේවයේ යෙදී සිටි කාලයේ උපයාගත් නිවාඩු කිසිවක් එහි දී ලබා ගැනීමට ඔහුට හිමිකමක් නොමැත. එමෙන්ම රාජ්‍ය සේවයට පෙරළා පැමිණි විට සංස්ථාවේ යෙදී සිටි කාලය තුළ දී උපයාගත් නිවාඩු සඳහා ද කිසිදු හිමිකමක් ඔහුට නොමැත.

6.8 විශ්‍රාම ගැනීමෙන් අනතුරුව සේවයේ යොදවන නිලධරයෙකුගේ නිවාඩු

විශ්‍රාම ගැනීමෙන් අනතුරුව නැවත සේවයේ යොදවන නිලධරයෙකුට ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 37 වගන්තියෙහි විධිවිධාන පරිදි එසේ සේවයේ යොදවන්නේ සේවා කඩවීමක් නොමැතිව නම් නැවත සේවයේ යොදවන ලිත් වර්ෂයේ දී නැවත සේවයේ යෙදවීමට පෙර සිටි තනතුරේ ඉතිරි නිවාඩු ඔහුට ලබා දිය හැකි අතර ඊට පසු ලිත් වර්ෂය සඳහා නම තනතුරට අදාළ නිවාඩු ලබා දිය හැකි ය. නිලධරයා සේවා කඩවීමක් ඇතිව නැවත සේවයේ යොදවන අවස්ථාවක දී නැවත සේවයේ යොදවන ලද කාලය සඳහා නැවත සේවයේ යොදවන ලද ලිත් වර්ෂයේ තනතුරට අදාළ අනුපාතික නිවාඩු ලබාදිය හැකි අතර ඊට පසු ලිත් වර්ෂය සඳහා ඉහත පරිදි තනතුරට අදාළ සාමාන්‍ය නිවාඩු ලබා දිය හැකි ය.

7. දිවයිනෙන් බැහැර නිවාඩු

මූලික නිවාඩු වර්ගීකරණය යටතේ රාජ්‍ය නිලධරයන්ට මෙරට තුළ ගත කිරීම සඳහා නිවාඩු මෙන්ම දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා ද නිවාඩු අනුමත කළ හැකි බව අවධානයට ලක් කරන ලදී. මෙසේ දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා අනුමත කරන නිවාඩු, පෞද්ගලික නිවාඩු ලෙස හෝ නිල රාජකාරි නිවාඩු ලෙස අනුමත කළ හැකි ය. නිලධරයෙකුගේ පෞද්ගලික කරුණු වෙනුවෙන් තමා විසින්ම ඉල්ලුම් කරන නිවාඩු පෞද්ගලික විදේශ නිවාඩු ලෙස හා අභ්‍යාස/ පාඨමාලා සඳහා රජය විසින් නිලධරයෙකු විදේශයකට යවන අවස්ථාවලදී අනුමත කරන නිවාඩු රාජකාරිමය විදේශ නිවාඩු ලෙස ද සැලකේ. දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩුවේදී සෙනසුරාදා, ඉරිදා හා රාජ්‍ය නිවාඩු දින ද එකී නිවාඩුවේ කොටසක් ලෙස සැලැකෙන අතර පෞද්ගලික විදේශ නිවාඩු ඉල්ලුම් කිරීමේදී භාවිත කළ යුතු ඉල්ලුම්පත්‍රය වනුයේ පොදු 126 ආකෘති පත්‍රයයි. විශේෂයෙන්ම මෙම පරිච්ඡේදය තුළ රාජ්‍ය නිලධරයෙකු පෞද්ගලික විදේශ නිවාඩු ලබා ගැනීමේ දී බලපැවැත්වෙන විධිවිධාන හා දැනුම්වත් විය යුතු කරුණු සම්බන්ධයෙන් මූලික අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වේ. මෙහි දී මූලික අවධානයට ගත යුතු කරුණු බැවින් පෙර පරිච්ඡේදවල ද සාකච්ඡා කළ පරිදි රාජ්‍ය නිලධරයෙකුට දිවයිනෙන් බැහැර ගත කිරීම සඳහා කිසිදු අවස්ථාවක අනියම් නිවාඩු ලබා දීමේ හැකියාවක් නොමැති බවයි.

7.1 මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරන් සඳහා දිවයිනෙන් බැහැර නිවාඩු

මාණ්ඩලික නිලධරයන්ට දිවයිනෙන් බැහැර නිවාඩු අනුමත කිරීමේ දී සාමාන්‍ය විවේක නිවාඩු විධිවිධානයන්ට යටත්ව නිවාඩු ඉල්ලුම් කරන වසරේ සහ ඊට කලින් දෙවර්ෂයේ නිවාඩු ලෙස උපරිම වර්ෂ 03ක ඉතිරි විවේක නිවාඩු ලබාදිය හැකි බව විවේක නිවාඩු විධිවිධානයට යටතේ සඳහන් කර ඇත. මෙම නිවාඩු සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලෙස ලබා දිය හැකි අතර එම ප්‍රමාණයට අමතරව තවදුරටත් පරිවර්තිත අඩ වැටුප් නිවාඩු ද ලබා දිය හැකි ය. කෙසේ වෙතත් එක් වරකට මේ ආකාරයෙන් ලබා දිය හැකි වර්ෂ 03ක ඉතිරි විවේක නිවාඩුවල සහ පරිවර්තිත අඩ වැටුප් නිවාඩුවල උපරිමය මාස 06කට සීමා කර තිබේ. එනම් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයෙකුට සිය පෞද්ගලික නිවාඩු ලෙස සම්පූර්ණ වැටුප් සහිතව දිවයිනෙන් බැහැර ගත කළ හැකි උපරිම නිවාඩු ප්‍රමාණය මාස 06කට සීමා වේ. එතකුදු වුවත් විශේෂ කරුණු ඉදිරිපත් කර ඇති විට මෙම මාස 06ක සීමාව ඉක්මවා නිවාඩු අනුමතිය ලබා දීමට රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්ගේ අනුමතිය මත සිදු කළ හැක. එසේ මාස 06න් ඔබ්බට ලබා දෙන නිවාඩු අවස්ථාවෝචිතව අඩ වැටුප් සහිත හෝ වැටුප් රහිත නිවාඩු ලෙස ලබා දිය යුතු ය. මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයන්ට මෙන් පරිවර්තිත අඩ වැටුප් නිවාඩු ද වැටුප් සහිත නිවාඩු ලෙස සිය පෞද්ගලික නිවාඩු සඳහා භාවිත කිරීමේ වරප්‍රසාදය ලබා දී ඇති බැවින් ඔවුන්ට කිසිදු අවස්ථාවක ආයතන සංග්‍රහයේ XII වැනි

අධ්‍යාපන අනධ්‍යයන
සේවක සංගමය
01 JUN 2022